පිවිතුරු ඉපැයීමකින් ඉඳි ගෙඩියක තරම් වටිනාකමක් ඇති යමක් පරිත්යාග කළේ නම්, -අල්ලාහ් පිවිතුරු දෑ මිස පිළිගන්නේ නැත.- එවිට සැබැවින්ම අල්ලාහ් ඔහුගේ දකුණතින් එය පිළි ගනියි. පසුව එහි හිමියාට එය වර්ධනය කර දෙයි. එය ඔබ අතරින් යමෙකු අශ්ව පැටවකු කන්දක් මෙන් තරමට වැඩෙන තෙක් හදාවඩා ගන්නාක් මෙනි.

අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී.“පිවිතුරු ඉපැයීමකින්
ඉඳි ගෙඩියක තරම් වටිනාකමක් ඇති යමක් පරිත්යාග කළේ නම්, -අල්ලාහ් පිවිතුරු දෑ මිස පිළිගන්නේ නැත.- එවිට සැබැවින්ම අල්ලාහ් ඔහුගේ දකුණතින් එය පිළි ගනියි. පසුව එහි හිමියාට එය වර්ධනය කර දෙයි. එය ඔබ අතුරින් යමෙකු අශ්ව පැටවකු කන්දක් මෙන් තරමට වැඩෙන තෙක් හදාවඩා ගන්නාක් මෙනි.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

කවරෙකු කිසිදු වංචාවක් හෝ රැවටීමකින් තොරව නිත්යානුකූල ලෙසින් උපයන දැයින් රට ඉඳි ගෙඩියක වටිනාකමක් ඇති යමක් පරිත්යාග කරන්නේද -අල්ලාහ් අනුමත පිවිතුරු දෑ හැර වෙන කිසිවක් පිළිගන්නේ නැත.- එවිට සැබැවින්ම අල්ලාහ් තම දකුණතින් එය පිළිගනු ඇත. එය මතුපිට අර්ථය වේ. කිසිදු වෙනස් කිරීමකින් තොරව අල්ලාහ් එය සම්බන්ධ කොට පවසා ඇත. එහි අදහස ඔහුගෙන් එය ඔහු පිළිගන්නේය. මුස්ලිම්හි සඳහන් තවත් වාර්තාවක එය ඔහු තම දකුණතින් ගෙන එහි ප්රතිඵල ගුණ කරනු ඇත. එය කුඩා අශ්ව පැටවකු ලොකුමහත් වන තුරු හදාවඩා ගන්නාක් මෙනි.

https://sunnah.global/hadeeth/si/show/5862